කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010
2012 ජනවාරි / පෙබරවාරි

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ සංස්කෘතිය - BUCU E 2025

බෞද්ධ සමාජ චින්තාව - පුදසිරිත් හා උත්සව

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

01. ''මිනිස් සමාජය තුළ විෂමතා ඇතිවන්නේ ඊශ්වර නිර්මාණය අනුව හෝ අහේතුකව නොවේ. මානව ක්‍රියාකාරකම් අනුවය.'' බෞද්ධ ඉගැන්වීම් අනුව විමසන්න.

02. මිනිසාට ස්වශක්තියෙන් ක්‍රියා කිරීමෙන් දෙලොව යහපත මෙන් ම විමුක්තිය ද උදාකරගත හැකි බව බුද්ධ දේශනා ඇසුරින් පැහැදිලි කරන්න.

03. එකිනෙකාගේ වගකීම් විධිමත්ව ඉටුකිරීම පවුල් සංස්ථාවේ අභිවෘද්ධියට ඉවහල් වන ආකාරය බුදුදහම අනුව පරීක්ෂා කරන්න.

04. වත්මන් සමාජය වෙත ද අවධානය යොමු කරමින් සමාජය නොයෙක් නයින් පිරිහීමට තුඩුදෙන මානව චර්යාවන් කවරේදැයි බුද්ධ වචනයෙන් නිදසුන් දෙමින් පෙන්වා දෙන්න.

05. ''ආර්ථික සුරක්ෂිතතාවයෙකින් තොරව ධාර්මික සමාජයක් ඇති නොවේ.''

06. රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් තුළින් වත්මන් දේශපාලනයට ලබාගත හැකි මගපෙන්වීම් කවරේදැයි සනිදර්ශනව පැහැදිලි කරන්න.

07. ආගමික විවිධත්වය තුළ බෞද්ධයෙකු කෙසේ ක්‍රියා කළ යුතුදැයි බුදුසිරිත හා බුදුදහම ද අනුව පෙන්වා දෙන්න.

08. පරිත්තසජ්ඣායනයෙහි අරමුණු පැහැදිලි කරමින් මෙරට ජනප්‍රියව ඇති විවිධ පිරිත් දේශනා පිළිබඳ විවරණයක් කරන්න.

09. නූතන ශ්‍රී ලංකාවේ ආරාමකේන්ද්‍රීය බෞද්ධ පුද සිරිත් බුදු දහම සමග කෙතෙක්දුරට එකඟවන්නේද'යි සාකච්ඡා කරන්න.

10. ලක්දිව ගැමි ශාන්තිකර්මවල දක්නා ලැබෙන බෞද්ධ ආභාෂය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

*******************************